## 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය

නිර්මාණකරුවා සම්ප්‍රදායයෙහි ම එල්බ නො සිට නිර්මාණාත්මක චින්තනය මෙහෙයවා ක්‍රියා කළ යුතු වේ. වෘත්තීන් තේමා කර ගත් නර්තන නිර්මාණයේ දී ඒ ඒ වෘත්තීන්හි සුවිශේෂතා පිළිබඳ ව විමසා බැලිය යුතු ය.

එසේ තෝරා ගත් වෘත්තීන් කිහිපයක් ලෙස ධීවර, මැටි, පතල්, තේ, කොහු සහ කෘෂි කර්මාන්ත හැඳින්විය හැකි ය. මෙම වෘත්තීන් පිළිබඳ නර්තන නිර්මාණ කිරීමට පෙර ඒවායේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතු ය.

| | | |
|---|---|---|
| **ධීවර කර්මාන්තය** | - | දියඹට ඔරුව රැගෙන යෑම<br>දැල් එළීම, දැල් ඇදීම<br>මාළු රැස් කිරීම, මාළු වර්ග කිරීම<br>අලෙවිය හා සතුටු වීම |
| **මැටි කර්මාන්තය** | - | මැටි කැපීම, මැටි පෑගීම, සකපෝරුවේ වළන් සෑදීම, වළන් තැලීම, පෝරණුවට වළන් දැමීම, විවිධ භාණ්ඩ නිෂ්පාදනය, අලෙවිය හා සතුටු වීම. |
| **පතල් කර්මාන්තය** | - | පතලට යෑම, පතල කැණීම, ඉල්ලම් ගැරීම, මැණික් වෙන් කිරීම, විවිධ ආභරණ නිෂ්පාදනය, අලෙවිය හා සතුටු වීම. |
| **තේ කර්මාන්තය** | - | පැළ සිටුවීම, ගස් කප්පාදු කිරීම, දළු නෙලීම, දළු වේලීම, කුඩු කර ගැනීම අලෙවිය හා සතුටු වීම. |
| **කොහු කර්මාන්තය** | - | පොල් ලෙලි එකතු කර දියට දැමීම, පොල් ලෙලි තැලීම, පොල් ලෙල්ලෙන් කොහු වෙන් කිරීම, ලණු ඇඹරීම, වර්ණ ගැන්වීම, විවිධ භාණ්ඩ නිෂ්පාදනය, අලෙවිය හා සතුටු වීම. |
| **කෘෂි කර්මාන්තය** | - | බිම සකස් කිරීම, පැළ සිටුවීම, පැළ නඩත්තුව, අස්වනු නෙලීම, අස්වනු ගබඩා කිරීම, අලෙවිය හා සතුටු වීම. |

ඉහත දක්වා ඇති ජීවන වෘත්තීන් සඳහා නර්තන නිර්මාණ කිරීමේ දී චලනවල ඖචිත්‍ය භාවය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. මෙහි දී නිදහස් අංග චලන භාවිත කිරීමට හැකි වන අතර, සාම්ප්‍රදායික අංග චලන වුව ද යොදා ගත හැකි ය. සෑම නිර්මාණයක් ම

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

ඔපවත් වීමට රංග රටා නිර්මාණය හා අවකාශ භාවිතය වැදගත් වනවා මෙන් ම තේමාවේ ක්‍රමික ගලා යෑමට එය බලපායි.

නර්තන නිර්මාණකරණයේ දී විවිධ වෘත්තීන්ට අදාළ ව ඉදිරිපත් කර ඇති පින්තූරවල ඉරියව් නිරීක්ෂණය කිරීම වැදගත් වනු ඇත.









(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)





විවිධ වූ වෘත්තීන්ට අදාළ නිර්මාණකරණයේ දී අවස්ථාවන්ට උචිත ලෙස වාදනය සිදු කිරීම එම නිර්මාණයේ සාර්ථකත්වයට ඉමහත් රුකුලක් වේ. මෙහි දී තෝරා ගත් කර්මාන්ත පිළිබඳ ව වැඩිදුර අධ්‍යයනය කිරීම නර්තන හා බැඳී චලන නිර්මාණයට, වාදනයට වැදගත් වේ.

- **නර්තන නිර්මාණකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු**

    - අදාළ තේමාවට අනුව ක්‍රියාකාරකම් ගොඩනගා ගැනීම.
    - එම සිද්ධියට අදාළ චරිත හා සිදුවීම් හඳුනා ගැනීම.
    - සිද්ධියට අදාළ චලන නිරූපණය කිරීමට අවශ්‍ය තාල, රිද්ම අනුව වාදන නිර්මාණ කර ගැනීම.
    - ආරම්භය, මැද හා අවසානයේ වන සිදුවීම්වල ස්වභාවය ඉස්මතු කිරීම සඳහා සුදුසු නර්තන චලන හා ඉරියවු නිසි පරිදි භාවිතයට ගැනීම.
    - අවකාශ භාවිතය, රංග රටා, අභිනය, නියමිත අංගහාර පිළිබඳ අවධානය යොමු කරමින් නිර්මාණ කෘතියේ කලාත්මක භාවය වැඩි දියුණු කර ගැනීම.
    - චලන නිර්මාණයේ දී එකිනෙකා අතර පවතින සබඳතා මෙන් ම ගායනය හා වාදනය අතර පවතින සබඳතාව ද නිසි පරිදි පවත්වා ගැනීම.
    - අභ්‍යාස කිරීමෙන් සාර්ථක නිර්මාණයක් ඉදිරිපත් කිරීම.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

## කාර්ය පත්‍රිකාව

පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් මෙහි ඇති වගුව සම්පූර්ණ කරන්න.

- ඔබ ප්‍රදේශයේ පවතින වෘත්තියක් තේමාව ලෙස තෝරා ගෙන 1 තීරුවේ සටහන් කරන්න.
- එම වෘත්තියෙහි සිදු වන ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කරමින් එක් එක් ක්‍රියාකාරකම් පෙළගස්වා 2 තීරුවේ සටහන් කරන්න.
- එම ක්‍රියාකාරකම්වල යෙදෙමින් ඒ සඳහා ගැළපෙන තාල රූප තෝරා 3 තීරුවේ සටහන් කරන්න.
- තෝරා ගත් තාල රූපවලට (3 තීරුවේ සඳහන්) අදාළ බෙර පද 4 තීරුවේ සටහන් කරන්න.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| තෝරාගත් තේමාව | අදාළ චලන ක්‍රියාකාරකම් | තාල රූපය | බෙර පද |
| | | | |

- මෙම ආකෘතිය ඇසුරු කර ගනිමින් කෙටි නර්තන නිර්මාණයක් ගොඩනගන්න.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)